The Network for Religious and Traditional Peacemakers

FCA Finn Church Aid

This Project is funded by the European Union.

**AHA ! Awareness with Human Action ව්‍යාපෘතිය**

# ව්‍යාපෘති නිවේදනය - මූල්‍ය ප්‍රදානයන් පිළිබඳ විස්තරය, නිර්ණායක සහ අයදුම් කිරීමේ ක්‍රියාවලිය

ශ්‍රී ලංකාව, පාකිස්තානය හා බංග්ලාදේශය ඇතුලු දකුණු ආසියානු කළාපයේ රටවල ප්‍රජාවන් අතර ගැටුම් ඇතිවීම වැලැක්වීම, සමාජ ඒකාබද්ධතාව වර්ධනය කිරීම ඔස්සේ කෝවිඩ් 19 හේතුවෙන් හටගෙන තිබෙන සමාජ බලපෑමට ප්‍රතිචාර දැක්වීම ඉලක්ක කරගනිමින් AHA ! Awareness with Human Actionව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. කෝවිඩ් 19 පිළිබඳව දැනුවත්බව තවදුරටත් වර්ධනය කිරීම සහ ඇතැම් සමාජ කණ්ඩායම් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වන වෛරී භාෂණය, වෙනස් කොට සැළකීම හා කොන් කිරීම අවම කිරීම සඳහා යහපත් පණිවිඩ සමාජ ගත කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු අතර වේ. යුරෝපා සංගමයේ මූල්‍ය ආධාර මත මෙය ක්‍රියාත්මක වේ.

සත්‍ය තොරතුරු පදනම් කරගනිමින් සංනිවේදයන කිරීම දිරිගැන්වීම හා ඒ ඔස්සේ මානව සහයෝගීතාව ශක්තිමත් කිරීමට, ප්‍රජාවන් අතර වඩාත් බලපෑම් සහගත පාර්ශවයන් ලෙස සැළකෙන ආගමික නායකයින්, තරුණ හා කාන්තා නායකයින් මේ ඔස්සේ මූලික වශයෙන් අමාන්ත්‍රණය කිරීමට නියමිතය. දකුණු ආසියානු කළාපයේ මානුශීය සහ සේවාවන්හි නියුතු සංවිධාන කිහිපයක එකමුතුවෙන් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියෙහි ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරීත්වය සර්වෝදය ව්‍යාපාරය විසින් සිදු කරනු ලබයි.

ඒ යටතේ පහත සඳහන් ප්‍රධාන අංශයන් ඔස්සේ දේශීය සංවිධානයන්ට හා සුදුසුකම් සපුරාලන පුද්ගලයින්ට කුඩා පරිමාණ ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රදානයන් සහ ධාරිතා වර්ධන සිදු කිරීමට නියමිතය.

1. **කුඩා ප්‍රමාණයේ මූල්‍ය ප්‍රදානයන්** - කෝවිඩ් 19 පිළිබඳව දැනුවත්බව තවදුරටත් වර්ධනය කිරීම සහ ඇතැම් සමාජ කණ්ඩායම් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වන වෛරී භාෂණය, වෙනස් කොට සැළකීම

හා කොන් කිරීම අවම කිරීම සඳහා යහපත් පණිවිඩ සමාජ ගත කිරීම සඳහා ප්‍රජා මට්ටමින් සිදුකෙරෙන කුඩා ව්‍යාපෘතීන් 50 සඳහා මූල්‍ය ප්‍රදානයන් සිදුකරයි. ඉන් 15 ක් ශ්‍රී ලංකාවේ සංවිධාන සඳහා පිරිනමනු ලබයි.

2. **ධාරිතා වර්ධනය හා සහයෝගීතා ඉගෙනීම** - ප්‍රමාණයේ මූල්‍ය ප්‍රදානයන් ලබන්නන් වසරක් පුරා මාර්ගගත (online) ධාරිතා වර්ධනය හා සමගාමී කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාවලියට සහභාගී වේ.
3. **ඩිජිටල් තාක්ෂණික ධාරිතාවයන් වර්ධනය කිරීම** - ඩිජිටල් තාක්ෂණික ධාරිතාවයන් වර්ධනය කර ගැනිමේ සඳහා සහාය ලබා ගැනීමට ද මේ යටතේ අයදුම්කරුවන්ට ඉල්ලුම් කළ හැක. තොරාගනු ලබන 50 දෙනා අතර 20 දෙනෙකු සඳාහා පමණක් එම අවස්ථාව හිමිවේ.

**මෙම මූල්‍ය ප්‍රදානයන් සඳහා යෝග්‍ය වන ක්‍රියාකාරකම් පහත පරිදි වේ,**

- විශ්වාසය ගොඩනැංවීම, සංවාද, ධාරිතා වර්ධනය, COVID 19 පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම වැනි ක්‍රියාවන් ඔස්සේ ප්‍රජාව සමග සම්බන්දතාව ඇතිකිරීම (සත්‍ය තොරතුරු ඇතුළුව සහ වැරදි තොරතුරු පැතිරීම වැළැක්වීම ඇතුලත්ව);

- වෛරී භාෂණය, කොන්කිරීම, වෙනස් කොට සැළකීම වැනි දෑ වලට එරෙහි තොරතුරු බෙදාහැරීමේ හා COVID 19 සමය තුළ  සමගිය ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රණ;

- COVID 19 සමය තුළ වෛරී භාෂණය, කොන් කිරීම, වෙනස් කොට සැළකීම්, සාවද්‍ය තොරතුරු බෙදා හැරීම ආමන්ත්‍රණය කිරීම සඳහා ගැටුම් සංවේදී ක්‍රමෝපායන් සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය හා ජාතික ආයතන, සෞඛ්‍ය අංශ, මාධ්‍ය හා අනෙකුත් පාර්ශව සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීම;
- COVID 19 සමය තුළ සමය තුළ විවිධ බෙදුනු අදහස් සහිත සමාජ, දේශපාලන හා ආගමික කණ්ඩායම් අතර අනෙකා විද දරාගැනීම, අන්තර් පුද්ගල අවබෝධය හා සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය සඳහා

සංවාද හා අන්තර් ප්‍රජා විශ්වාසය ගොඩනැංවීමේ වැඩසහටන් සහ සංවාද ;

- මාධ්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය, වෛරී භාෂණයට එරෙහි විශ්ලේෂණාත්මය සිතීම, අවිහිංසාව වැනි දෑ ඉලක්ක කර ගනිමින් COVID 19 සමය තුළ මාධ්‍ය සහ සංනිවේදන ක්‍රියාකාරකම්;

- ප්‍රජාවන් ඉලක්ක කරගනිමින් සාමය පිළිබඳ විධිමත් හා අවිධිමත් අධ්‍යාපනය ලබාදීම, සාමකාමී සංස්කෘතිය, අන්තර් සංස්කෘතික සංවාද හා සහයෝගීතාව, විවිධත්වයට ගරු කිරීම ප්‍රවර්ධනය සහ අන්තර් පාර්ශව සාකච්ඡාව, ගැටුම් නිරාකරණය, එකඟතාවන් ගොඩනැංවීම සඳහා අවශ්‍ය හැකියාවන් වර්ධනය කිරීම යනාදිය

## වැදගත්,

මෙම මූල්‍ය ප්‍රදානය සඳහා තොරාගනු ලබන ව්‍යාපෘතින් ආරම්භ කළ යුතු කාලය - 2020 නොවැම්බර්

ව්‍යාපෘතියක කාල සීමාව - මාස 4ත් 9ත් අතර

නව ව්‍යපෘතින් සහ කළින් සිදු කරන ලද වැඩසටහන් වල සාර්ථකත්වයන් මත පදනම්ව සකස් කරන ව්‍යාපෘතින් මේ සඳහා ඉදිරිපත් කළ හැක.

මූල්‍ය ප්‍රදානයන් සඳහා තෝරාගනු ලබන්නේ යෝජිත ව්‍යපෘතීන්හි ඉහළ සමාජ බලපෑම, ප්‍රජාවන් අතරට ප්‍රවේශ වන ප්‍රමාණය, කාලෝචිතබව, දැනට සිදු කරන සහ යෝජිත ක්‍රියාකාරකම් වල ගුණාත්මක භාවය හානවෝත්පාදන වටිනාකම්, අගය එකතු කිරීමේ හැකියාව සළකා බැලීමෙනි.

අයදුම්කරුවන්ගේ භූගෝලිය, ආගමික, ස්ත්‍රී පුරුෂ හා වයස් සීමා විවිධත්වය ආරක්ෂාවන පරිදිඅවසන් කණ්ඩාමය තේරීමට නියමිතය.

## මූල්‍ය ප්‍රදානය සඳහා සළකා බැලෙන වඩාත් තරඟකාරී අයදුම් කරුවන් පහත ලක්ෂණ වලින් සමන්විය යුතුය,

- යෝජිත ක්‍රියාකාරකම් ගැටලු සහ ප්‍රජා අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම,
- අරමුණ හා ක්‍රියාකාරකම් නිසි පරිදි සඳහන් කිරීම

- එම අරමුණු සාක්ෂාත් කරගැනීමෙන් වෛරී භාෂණය, වෙනස් කොට සැළකීමට එරෙහි ප්‍රාජ මට්ටමේ ප්‍රාතිචාරයන් වර්ධනය වන ආකාරය සඳහන් කිරීම.
- අවම වශයෙන් 50 දෙනෙකුගෙන් යුතු ප්‍රතිලාභීන් සඳහා ව්‍යාපෘතිය ළගාවීම පෙන්වාදීම (ස්ත්‍රී පුරුෂ අගයන් වෙන් වෙන් වශයෙන් )
- ක්‍රියාකාරකම් මගින් තරුණ, කාන්තා හා ආගමික නායකයින් ඉලක්ක වන ආකාරය පැහැදිලිව දැක්වීම
- අවශ්‍යතාව හා වහා කළ යුතු බව පදනම් කරගනිමින් කාල රාමුව යෝජනා කිරීම
- ක්‍රියාකාරකම් වලදී ගැටුම් සංවේදීතාව සැළකිල්ලට ගැනීම හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, තරුණ සහභාගීත්වය හා සියලුදෙනා ඇතුලත් වන ආකාරය විස්තර කිරීම
- දීර්ඝ කාලීන සමාජ ඒකාබද්ධතාව සඳහා ක්‍රියාකරකම් දායක වන ආකාරය සඳහන් කිරීම
- මිට ඉහත මෙවැනි ක්‍රියාකාරකම් සිදු කිරීම සහ මූල්‍ය ප්‍රදානයන් කළමණාකරනය පිළිබඳව ආයතනික අත්දැකීම සඳහන් කිරීම.
- යෝජිත වියදම් විස්තරාත්මකව දැක්වීම

ව්‍යාපෘති ප්‍රතිපාධන සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී, ආගමික, සංස්කෘතික, ලිංග භේදය, වයස,නියෝජනය කරන ප්‍රදේශය යන කාරණා සැලකිල්ලට භාජනය වේ.

මේ සඳහා අයදුම් පත් ඉදිරිපත් කල හැකි පුද්ගලයින් හා සංවිධාන පහත දැක්වේ.

| **රට** | **ලබාදෙන මුලු මූල්‍ය ප්‍රදානයක් සංඛ්‍යාව** | **සංවිධානයකට/ පුද්ගලයෙකුට ලබාදෙනු ලබන අවම හා උපරිම මූල්‍ය ප්‍රදානය** |
|---|---|---|
| පාකිස්ථානය | 15 | අවමය යූරෝ 2,000ක් හා උපරිමය යූරෝ 5,000ක් වන ප්‍රදානයන් 30 ක් ප්‍රජා ව්‍යාපෘති වෙනුවෙන් පුද්ගලයින් සඳහා ලබා දෙනු ලැබේ |
| බංග්ලාදේශය | 15 | |
| **ශ්‍රී ලංකාව** | **15** | **අවමය යූරෝ 3,000ක් හා උපරිමය යූරෝ 10,000ක් වන ප්‍රදානයන් 15 ක් ප්‍රජා ව්‍යාපෘති සඳහා ලබා දෙනු ලැබේ** |

| | | |
|---|---|---|
| දකුණු ආසියානු කළාපය | 05 | අවමය යුරෝ 2,000ක් හා උපරිමය යුරෝ 5,000ක් වන ප්‍රදානයන් සංවිධාන සඳහා ලබා දෙනු ලැබේ |
| | 50 | |

- පකිස්තානය, බංග්ලාදේශය සහ ශ්‍රී ලංකාව යන රටවල ප්‍රජා නායකයින් සහ සමාජ බලපෑම් කරන්නන්;

- COVID – 19 තත්වය හා සම්බන්ද වෛරී භාෂණය, වෙනස් කොට සැළකීම, කොන්කිරීම අවම කිරීම සහ සමාජ ඒකාබද්ධතාව හා සාමය ගොඩනැංවීම ප්‍රවර්ධනය පිළිබඳව කළාපීය වශයෙන් දැනට ක්‍රියාකාරකම් සිදු කරන හා/හෝ එවැනි දෑ පිළිබඳව උනන්දුවක් දක්වන ප්‍රජා නායකයින් හා බලපෑම් සහ ගතකරන්නන්;

- සාම්ප්‍රදායික නායකයින්, ආගමික නායකයින්, කාන්තා හා තරුණ කණ්ඩායම්වල නායකයින්, ප්‍රජා මූලික සංවිධාන, ආගමික කවුන්සිල/ සංවිධාන, ප්‍රාදේශීය සිවිල් සංවිධාන ජාල හෝ එවැනි පුද්ගලයින් (උනන්දුවක් දක්වන ක්‍රියාධරයින් හා සමාජ බලපෑම් කරන්නන්);

- බංග්ලාදේශය, පකිස්ථානය, ශ්‍රී ලංකාව හෝ නේපාලය හෝ ඉන්දියාව වැනි දකුණු ආසියානු රටවල ලියාපදිංචි සංවිධාන (මෙය කළාපීය අයදුම්කරුවන් සඳහා අදාළ වේ) මේ සඳහා අයදුම් කළ හැක.

පහත සබැඳිය (Link) ඔස්සේ ඔබ සංවිධානයට මේ සඳහා අයදුම් කළ හැක.

Link (ශ්‍රී ලංකාවේ අයදුම්පත් සඳහා)

ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ අයදුම් පත යොමු කිරීමට පෙර නිසි පරිදි පිළියෙල කර ගැනීම යෝග්‍යවේ. අයදුම්පත මෙහිදී (Link) ලබා ගත හැක. විද්‍යුත් තැපැල (E –mail ) මාර්ගයෙන්ද අයදුම්පත් එවිය හැක.

Questions concerning the application process are welcomed to Project Coordinator, Mr. Simon Woell (simon.woell@kua.fi) in cc Sarvodaya contact point, Project Manager, Ms. Manu Tissera (manu@sarvodaya.org) by 11 October 2020.

අයදුම්පත් යොමු කිරීම සඳහා අවසන් දිනය - **2020 ඔක්තෝම්බර මස 20 අඟහරුවාදා දින (ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව.3.29 ට පෙර )**

අනෙකුත් රටවල මෙය Religious and Traditional Peacemakers/ Finn Church Aid, World Faiths Development Dialogue, The Center for Peace and Justice - Brac University, Center for Communication and Development of Bangladesh, Islamic Relief Worldwide, Youth Development Foundation යන සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

එමෙන්ම යුරෝපා සංගමටය අමතරව යන Asia Muslim Action Network, International Network of Engaged Buddhists, United Network of Young Peacebuilders , KAICIID Dialogue Centre ආයතනද මේ සඳහා අනුග්‍රාහකත්වය දක්වයි.